# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2021 ජූනි මස 14 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2021 ජූනි මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 6.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2021 ජුනි මස 14 වන දින]

එල්.ඩී.—ඕ. 7/2021

## 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2021 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය

2. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2003 අංක 3 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) එම වගන්තියේ (ඉ) ඡේදයේ "සියයට දහයක්" යන වචන ඉවත් කර ඒ වෙනුවට "සියයට පහළොවක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (ඊ) ඡේදයේ "2020 ජනවාරි මස 1 වන දිනයෙන්", යන වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට "2030 ජනවාරි මස 1 වන දිනයෙන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි “ප්‍රකාශන පියස” හි දී මිල දී ගත හැකි ය.